# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2102/24 - 2018 දෙසැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2018.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ව/18/02/2014.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2016/ඩී/91.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ පරවශතාවේ විස්තරය:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, 179 ඇලපිටිවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නවම්මහර ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්. 4121 හා 2018.12.03 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0671 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල;

01. කැබලි අංක 01
ඉඩමේ නම: කජුගහකුඹුර; විස්තරය: විවෘත මුඩුබිම ඇළ; හිමිකම් කියන අය: අංක 79/2, ටෙම්පල් ලේන්, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල පදිංචි පද්මික ගයාන් රුවන්පුර; ප්‍රමාණය: හෙක්. 0.0671.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2019 මාර්තු මස 20 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 මාර්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල් හා ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

පී.ඩී.ටී.සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2018 දෙසැම්බර් මස 17 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-39